**පොතුවිල් ප්‍රාදේශිය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**---------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 20 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 29 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 24 දින සභාවේ, සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට පොතුවිල් ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
-----------------------------------------------------------

පළාත් පාලන පළාත් සභා අමාත්‍යාංශය ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීජ්/එස්එල්පීඑස්ජ්එස් දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

සමාලෝචිත වර්ෂයේදි යුනොප්ස් (UNOPS) ආයතනයෙන් පරිත්‍යාගයක් වශයෙන් ලැබූ තිබූ කාර්යාල උපකරණ 13 ක වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

1.3.3 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්
------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) කඩ කාමර බදු ගන්නා ලද 71 දෙනෙකුගෙන් රු. 2,316,441 ක හිඟ මුදල අයකර ගැනීම සඳහා 2014 අප්‍රේල් 04 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 වන වර්ෂයේ සභාවෙන් මාරුවී ගොස් ඇති නිලධාරින් හතර දෙනෙකුගේ ණය ශේෂය වන රු. 435,683 ක මුදල ස්ථාන මාරු වී ගොස් ඇති ආයතනවලින් අයකර ගැනීම සඳහා 2014 අප්‍රේල් 04 වන දින දක්වා කටයුතු කර නොතිබුණි.

1.3.4 නීති, රීති සහ රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) නැගෙනහිර පළාත් මුදල් රෙගුලාසි අංක 432(1) | වාහන දෙකක් අළුත්වැඩියා කිරීම සඳහා 2013 වර්ෂයේ රු. 183,182 ක මුදලක් වැයකර තිබූ අතර 2014 අප්‍රේල් 04 දින දක්වා වාහන ලොග් සටහන් පොතේ එය සටහන් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු. රෙ. 135 | අනුමත කිරීම, සහතික කිරීම යන රාජකාරි නිලධාරින් අතර බෙදා දිය යුතුය. එසේවුවද එකතුව රු. 2,857,483 ක වවුචර් පත් 70 ක් සම්බන්ධයෙන් අනුමත කිරීම සහ සහතික කිරීම් යන රාජකාරි සභාවේ සභාපතිවරයා විසින්ම කර තිබුණි. |
| (ii) මු. රෙ. 571(2) | රු. 71,600 ක් වටිනා කල් ඉකුත්වූ තැන්පතු අදාල පාර්ශවයන්ට ගෙවීමට හෝ ආදායමට මාරු කිරීමට 2014 අප්‍රේල් 04 දින දක්වා කටයුතු කර නොතිබුණි. |
| (ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛන අංක බිඑෆ්/437 | වාහන සඳහා රක්ෂණ, ජාතික රක්ෂණ භාරකාර අරමුදලෙන් හෝ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ භාරකාර අරමුදලින් පමණක් ලබා ගතයුතු බව සඳහන් කර ඇතත් එයට පටහැනිව වාහන තුනක් සඳහා රු. 250,398 ක මුදලක් ගෙවා පුද්ගලික රක්ෂණ ආයතනකින් රක්ෂණ ආවරණ ලබාගෙන තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 1,575,692 ක් වූ අතර එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම් රු. 1,850,025 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 3,425,717 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් පරිපාලනය

----------------------

2.2.1 උසාවි දඩ මුදල්

-----------------

2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ මුදල් ප්‍රමාණය නැගෙනගිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

2.2.2 වෙනත් ආදායම්

------------------

සභාවේ බල ප්‍රදේශයේ පෞද්ගලික ආයතනයන් විසින් ඔවුන්ගේ වෙළද භාණ්ඩ ප්‍රචාරය කිරීම සඳහා ස්ථාපිතකරන ලද ප්‍රචාරක දැන්වීම් පුවරු 03 ක් සඳහා සහ විදුලි සංදේශ ආයතනයන් විසින් ස්ථාපිත කරන ලද විදුලි සංදේශ කුළුණු 07 සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය සඳහා අයකර ගතයුතු රු. 84,000 ක පමණ ආදායම් සභාවට අහිමිවී තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

2008 වර්ෂයේ සිට 2012 වර්ෂය අවසානය දක්වා කොන්ත්‍රාත් කරුවන්ගෙන් අයකර ගෙනතිබූ එකතුකල අගය මත බදු රු. 2,422,520 ක මුදල දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්වෙතට ප්‍රේෂණය කිරීම සඳහා විගණන දිනය වන 2014 අප්‍රේල් 04 දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

3.2 නිෂ්ක්‍රිය වත්කම්

-------------------

සභාව විසින් 2008 වර්ෂයේ රු. 731,600 ක මුදලකට මිලදීගෙන තිබූ කඩදාසි ප්‍රතිචක්‍රීය කිරීමේ යන්ත්‍රය අදාල කාර්‍ය්‍ය සඳහා ප්‍රයෝජනයට නොගෙන 2014 අප්‍රේල් 04 දින දක්වා ගබඩාවේ තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

එක් එක් පළාත් පාලන ආයතන තම තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා ගතයුතු බවට වූ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන පළාත්පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ 8 වන වගන්තිය පරිදි සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

5. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) ආදායම් රැස්කිරීම